සැ. යු. - 2022.07.01 දින පළ කරන ලද අංක 2287 ගැසට් පත්‍රයේ III හා IV(අ) කොටස් පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,288 - 2022 ජූලි මස 08 වැනි සිකුරාදා - 2022.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය	—
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය	—
වෙනත් පත්කිරීම්	—
පළාත් සභා නිවේදන	—
අතුරු ව්‍යවස්ථා	1074
තනතුරු ඇබෑර්තු	—
විභාග විභාග ප්‍රතිඵල ආදිය	—
ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්	—
බඩු බාහිරාදිය විකිණීම්	—
තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්	—
විවිධ දැන්වීම්	—

සැ. යු.- (i) සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත් කෙටුම්පත 2022 ජූනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) කාර්මික ආරාවුල් (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූලි මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අතුරු ව්‍යවස්ථා

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබූ හා 2020.06.11 දින පැවති මහා සභාවේ තීරණ අංක 05(i) දරන යෝජනාව මගින් සම්මතව ඇති මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123(1) වගන්තිය ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව වන මවිසින් අනුමත කරන ලද බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2022 අප්‍රේල් මස 25 වැනි දින,
සබරගමුව පළාත් සභාව.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කෙරෙන සියලුම ප්‍රචාරක දැන්වීම් මහජනයාට හා පරිසරයට හිතකර අන්දමින් නීතිරීතිවලට අනුකූලව විධිමත් ව නියාමනය කිරීම හා පාලනය කිරීම මෙම අතුරු ව්‍යවස්ථාවේ අරමුණ වේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්වේ.

3. (i) කවර හෝ තැනැත්තෙකු විසින් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු බල ප්‍රදේශය ලෙස හඳුන්වනු ලබන) කවර හෝ පරිශ්‍රයක සභාපතිවරයා විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් ඇත්තේ නම් මිස ප්‍රචාරක දැන්වීමක් පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

   (ii) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක් ම මෙහි පළමු වන උපලේඛනයට අනුකූලව පිළියෙල කරනු ලබන අයදුම් පත්‍රයක් යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කළ යුතු ය.

   (iii) මෙම වගන්තිය යටතේ වූ අවසර පත්‍රයක් සඳහා අය කළ යුතු ගාස්තු සභාව විසින් තීරණය කර පනවා අයකළ යුතු ගාස්තු විය යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතු ය.

5. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තෙකු ම විසින්, අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම ප්‍රචාරය කිරීමට අදහස් කරන දිනට වැඩ කරන දින 2කට පෙර මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කර අයදුම්පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

   (අ) අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක්ම සමඟ මිලි මීටර් 210ඃ මිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක, 1 : 1000 පරිමානයට අනුව පිළියෙල කළ භූමි සැලැස්මක්/සැලසුම් ඉදිරිපත් කර තිබිය යුතු අතර ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතු ය.

6. ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක ඒ බව සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. ඉල්ලුම්කරුට එකී දැන්වීම් ලැබීමෙන් අනතුරුව ඔහු විසින් 3(3) වන වගන්තියේ සඳහන් ආකාරයට අවසර පත්‍ර ගාස්තුව සහ 16(අ) වන වගන්තියේ සඳහන් ඇප මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබීමෙන් පසුව අදාළ අවසර පත්‍රය නිකුත් කිරීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතු ය.

(අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද කිසියම් කාර්යයක් හෝ මුදල් අයකිරීමකින් තොරව පවත්වනු ලබන යම් සංස්කෘතික කාර්යයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් අවසර පත්‍ර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය. එසේ වුව ද එවැනි ප්‍රචාරක දැන්වීමක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

7. ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහාම නිකුත් කළ අවසර පත්‍රයේ අංකය ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණුපස ඉහළ කෙළවරේ සටහන් කිරීම අවසර පත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන අවසාන දිනයෙන් පසුව පැය හතළිස් අටක් ගතවීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කරවීමට එකී අවසර පත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය සහ/හෝ ලිපිනය සමග වෙනත් කිසියම් වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක සහ කිසියම් නිවාසයක කවර හෝ ආකාරයේ වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීම් මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත් විය යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් අවසර පත්‍ර ලබා ගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමණාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතු ය.

10. (අ) සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා මෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නිකුත් කරන ලද වලංගු අවසරපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

(ආ) ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු අවසර පත්‍රයක් ලබා ඇත්තේ වුව ද කවර හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදාළ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථානවල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබූ කලාපයක් තුළට අයත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට වන ඉල්ලීමක් විය යුතු ය.

(ආ) දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තෙකුට කලින් නිකුත් කළ අවසර පත්‍රයක වලංගු කාල සීමාව අවසන් වී තිබිය යුතු ය. එසේ වුව ද කලින් නිකුත් කළ හා තවදුරටත් වලංගු අවසර පත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම දර්ශනය වීමට බාධාවක් නොවන පරිදි ඊට ආසන්නයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට මේ විධිවිධානය බාධාවක් නොවිය යුතු ය.

(ඇ) ප්‍රදර්ශන අවසර පත්‍රය ඉල්ලා සිටින දැන්වීම අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හානිකර හෝ කවර හෝ ආගමකට හෝ ජන වර්ගයකට හෝ ජන කොට්ඨාසයකට හානිවන හෝ එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන හෝ වදන් ඇතුළත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතු ය.

(ඈ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරනු ලැබ ඇති දැකුම් පැළැල්ලක ප්‍රදර්ශනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඇති අවස්ථාවක එකී දැකුම් පැළැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබිය යුතුවාත් හැර, ඒ අවස්ථාව වන විටත් කලින් නිකුත් කළ අවසර පත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා වෙන්කළ කාලය ඉකුත් වී තිබිය යුතු ය.

(ඉ) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොවිය යුතු ය.

12. ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිර වීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතු ය. එසේම වාහන පදවා ගෙන යනු ලබන කිසියම් රියදුරෙකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් හෝ ඔහුගේ දර්ශනයට අවහිර වන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා සවි කිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකර ඇති බවට ගමනාගමන උපදේශක කමිටුවේ නිර්දේශයක් ලබාගෙන මිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

13. ප්‍රදර්ශනය සඳහා වලංගු අවසර පත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතු ය.

14. කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක හෝ වෙනත් කිසියම් කොටසකට හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවිකිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම කවරෙකු විසින් හෝ නොකළ යුතු ය.

15. (අ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කවර හෝ ප්‍රදේශයක ප්‍රාදේශීය සභාව සතු කිසියම් ඉඩමක හෝ ප්‍රාදේශීය සභාව විසින් ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව ලබාගන්නා වෙනත් කිසියම් තැනැත්තෙකු සතු ඉඩමක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැලලි ඉදිකර පවත්වා ගෙන යාමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරනු ලැබ ඇති කිසියම් දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින්කල තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රදර්ශකයන්ගෙන් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

(ඇ) ඉහත (ආ) ඡේදයේ විධිවිධාන යටතේ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන වාර්ෂික අවසර පත්‍ර ගාස්තුව පිළිබඳ නිවේදනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

16. (අ) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලබන තෙක් සභාපතිවරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයට අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(ආ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළයුතු ඇප මුදල් ප්‍රමාණය පිළිබඳ ව ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන තීරණය *ගැසට්* පත්‍රයේ නිවේදනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

17. (අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ 08 වන වගන්තිය සඳහන් ආකාරයෙන් ක්‍රියා කිරීමෙන් අනතුරුව සභාපතිවරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත අදාළ අවසර පත්‍රය නිකුත් කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදල ආපසු ලබා ගැනීමට අවසරපත්‍රලාභියාට හැකි ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව එකී තැන්පත් මුදල බලපත්‍රලාභියා වෙත නිදහස් කිරීමට පෙර;

(i) මෙම අතුරු ව්‍යවස්ථාවේ 09 වන වගන්තියේ සඳහන් නියමයන් අවසරපත්‍රලාභියා විසින් නිසි ආකාරයට ඉටුකර තිබේද යන බව;

(ii) දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලැබ ඇත්තේ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරන ලද දැකුම් පැළැල්ලක වන අවස්ථාවක, ඒ දැන්වීම ඉවත් කිරීමේදී හෝ අවසරපත්‍රලාභියා විසින් වගකිව යුතු කිසියම් කාර්යයක් හේතුවෙන් හෝ එකී දැකුම් පැළැල්ලට කිසියම් හානියක් නොමැති බව;

තහවුරු කර ගැනීම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(ඇ) අවසරපත්‍රලාභියා විසින් 08 වන වගන්තියේ සඳහන් ආකාරයට ක්‍රියා කර ඇති බව සහ ප්‍රාදේශීය සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදු වී නොමැති බව, (අ) ඡේදයේ සඳහන් ආකාරයට තහවුරු කර ගැනීමේදී සභාපතිවරයා සෑහීමකට පත්වන්නේ නම් මිස එකී තැන්පත් මුදල අවසරපත්‍රලාභියා වෙත සම්පූර්ණයෙන් නිදහස් කිරීම නොකළ යුතු ය. කිසියම් අවසර පත්‍රලාභියෙකු විසින් 09 වන වගන්තියේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ ප්‍රාදේශීය සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී ඇති විට, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්යය කිරීම හෝ දැකුම් පැළැල්ල අලුත්වැඩියා කිරීම හෝ ඒ කාර්යයන් දෙකම සඳහා ප්‍රාදේශීය සභාවට දරන්නට සිදුවන වියදම් තැන්පත් මුදලින් අඩු කර ගත යුතු අතර ඉතිරි වන යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල පමණක් අවසරපත්‍රලාභියාට ආපසු ගෙවිය හැකිය.

(ඈ) ඉහත (ඇ) ඡේදයේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේදී ප්‍රාදේශීය සභාවට අය කර ගත යුතු මුදල තැන්පත් කරනු ලැබූ ඇප මුදලට වඩා වැඩි වන අවස්ථාවක, එසේ වැඩිදුරටත් අයවිය යුතු මුදල අවසරපත්‍රලාභියා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

18. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය හෝ පෙන්නුම් කෙරෙන වර්ග අඩි 25කට නොවැඩි දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, ගෘහ නාම පුවරු සහ කිසියම් දේපළක් බදුදීමට හෝ විකිණීමට හෝ කුලියට දීමට හෝ එකී දේපළ මත ප්‍රදර්ශනය කරනු ලබන ''බදු දීමට තිබේ'' හෝ ''විකිණීමට තිබේ'' හෝ ''කුලියට දීමට තිබේ'' යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුවද ඒ ආකාරයේ දැන්වීමේ පුවරු එකකට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන අවස්ථාවක එසේ වැඩිවන සෑම දැන්වීම් පුවරුවක් ම සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන බල පැවැත්විය යුතු ය.

19. රජය හෝ පළාත් සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

20. ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය,

(i) ප්‍රාදේශීය සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිකළ දැකුම් පැළැල්ලක් වන විට ඒ දැකුම් පැළැල්ලේ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ප්‍රාදේශීය සභාවට ගෙවා තිබිය යුතු ය.

(ii) ඉල්ලුම්කරු නොවන වෙනත් යම් තැනැත්තෙකුට හෝ යම් අධිකාරියකට අයත් ස්ථානයක් වන විට ඒ තැනැත්තා හෝ ඒ අධිකාරය විසින් එකී ප්‍රචාරක දැන්වීම ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර තිබිය යුතු ය.

21. මෙම අතුරු ව්‍යවස්ථා වලට අදාළ කටයුතු නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලය එහි සභාපතිවරයා හෝ ලේකම් විසින් සභාවේ කවර හෝ නිළධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

22. (අ) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ කිසියම් අවසර පත්‍රයක් කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස එකී බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිසියම් වර්ෂයක ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර දී ඇති කාලය නිමවීමෙන් පසු අවසන් කළ යුතු ය.

(ආ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයේ කාලය අවසන් වීමෙන් අනතුරුව අනුගාමී වර්ෂය තුළ දී ද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවක ඒ අනුගාමී වර්ෂය සඳහා එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව අවසර පත්‍රයක් ලබාගත යුතු ය. එසේ වුවද ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට නිකුත් කරනු ලබන බලපත්‍රයක් වෙනුවෙන් අනුගාමී වර්ෂයක් තුළ අයකිරීමට ප්‍රාදේශීය සභාව සම්මත කර ඇති අවසර පත්‍ර ගාස්තුව කුමක් වුවද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලබන නව අවසර පත්‍රය වෙනුවෙන් කලින් සම්මත කළ අවසර පත්‍ර ගාස්තුව අදාළ විය යුතු ය.

23. (අ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදාගනු ලබන කවර අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදි කිරීමක් හෝ සවි කිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගේ දේපළකට අන්තරාදායක වන හෝ හානිවන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්වයට පත් කරන ලෙස බලපත්‍රලාභියාට යොමු කරන දැන්වීමක් මගින් නියම කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිළධාරියාට බලය තිබිය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ සඳහන් කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කළ අවසර පත්‍රය අවලංගු කිරීම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(ඇ) ඉහත (ආ) ඡේදයේ විධිවිධාන යටතේ කිසියම් අවසර පත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල ප්‍රාදේශීය සභාව සතු විය යුතුවාත් හැර ඒ ඇප මුදල ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

24. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදිකිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ඉදිකිරීමක ආධාරකයක්, සවිකිරීමක් හෝ ඒ සඳහා පාවිච්චි කරන වෙනත් යම් කිසිවක් නිසා හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍ය වන අන්‍යාර්ථයක් හේතුවෙන්

කිසියම් පාර්ශවයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් අවසර පත්‍රලාභියා වගකීමට යටත් විය යුතු ය.

25. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් මගින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් ඇතුළත් වූ ලෙස නොසැලකිය යුතු අතර එලෙස තේරුම් ගැනීම ද නොකළ යුතු ය.

26. (අ) කිසියම් පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව ප්‍රාදේශීය සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදීම නීත්‍යානුකූල වන්නේ ය.

(ආ) 26 වගන්තියේ සඳහන් අදාල බලධාරියා විසින් ලබා දෙන ලද තීරණයකට එකඟ නොවන අයෙකුට එම තීරණය ලැබී දින 30ක් ඇතුළත සබරගමු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට හෝ පළාත් සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක ආණ්ඩුකාරවරයාට අභියාචනයක් ඉදිරිපත් කර විසඳුම් ලබා දීම නීත්‍යානුකූල වන්නේ ය.

27. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයක් කඩ කර ඇති අවස්ථාවක ඒ කඩකිරීම පිළිබඳව අවධානය යොමු කරන නිවේදනයක් සමඟ නිකුත් කරනු ලැබූ කිසියම් අවසර පත්‍රයක් අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

29. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත යුතු බලපත්‍රයකින් තොරව පරිශ්‍රයක් පවත්වාගෙන යාම හෝ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත්විය යුතු ය. එකී වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව දඩයකට යටත් කරන ලද තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් නොකඩවා කරගෙන යනු ලබන විටක එම උල්ලංඝනය පිළිබඳ අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම ඉහත කී වගන්තියේ අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල,

''සභාපතිවරයා'' යන්නෙන් ඉඹුල්පෙ ප්‍රාදේශීය සභාවේ තත් කාලයෙහි සභාපතිධුරය දරන තැනැත්තා ද,

''ප්‍රාදේශීය සභාව'' යන්නෙන් ඉඹුල්පෙ ප්‍රාදේශීය සභාව ද,

''ලේකම්වරයා'' යන්නෙන් තත් කාලයෙහි ඉඹුල්පෙ ප්‍රාදේශීය සභාවේ ලේකම් ධුරය දරන තැනැත්තා ද,

''බලයලත් නිලධාරි යන්නෙන්'' තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද,

''රථවාහන පොලිස් ස්ථානාධිපති යන්නෙන්'' තත් කාර්යය සඳහා මූලස්ථාන පොලිස් ස්ථානාධිපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ පොලිස් නිලධාරියෙකු ද,

''කටවුට්'' යන්නෙන්, ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කළ කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද ප්‍රචාරක දැන්වීමක් ද,

''දැකුම් පැළැල්ල'' යන්නෙන්, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද,

''ප්‍රචාරක දැන්වීම'' යන්නෙන්, කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශන කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරන කාර්යය සඳහා යොදා ගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළෙඳ දැන්වීමක් ද, අදහස් වන්නේ ය.

31. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවක් වුවහොත් සිංහල පාඨය බල පැවැත්වේ.

පළමුවන උපලේඛනය

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙතටයි.

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :...
2. ජාතික හැඳුනුම්පත් අංකය :...
3. දුරකථන අංකය :...
4. ඉල්ලුම්කරු නොපැමිණෙන්නේ නම්,

   නියෝජිතයාගේ නම සහ ලිපිනය :...
   ජාතික හැඳුනුම්පත් අංකය :...
   දුරකථන අංකය :...

5. දැන්වීම සම්බන්ධ විස්තර :

ප්‍රදර්ශනය කරන දැන්වීමේ දිග x පළල, ප්‍රදර්ශනය වන දැන්වීමේ වර්ග ප්‍රමාණය,

ස්ථානය	*(අඩි) ප්‍රමාණය*	*පැති ගණන*	*ගණන (මුළු)*
i.	....	....	....
ii.	....	....	....
iii.	....	....	....

6. ප්‍රදර්ශනය කරන්නට යෙදෙන දැන්වීමේ විස්තරය :
   ....
   ....
   ....
   (දැන්වීමේ පිටපතක් අමුණා එවිය යුතු ය.)

7. දැන්වීමේ ප්‍රදර්ශනය කරන කාලය .... සිට .... දක්වා

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථාවන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමටත්, නියමිත දිනට දැන්වීම ඉවත් කර ගැනීමටත් මේ හා සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන නිගමනයන් හා උපදේශනයන් පිළිපැදීමටත්, මම මෙයින් පොරොන්දු වෙමි. එම කොන්දේසි කඩ කළහොත් ඇප මුදල් ප්‍රාදේශීය සභාව සතු වන බවත් දනිමි.

තව ද, මෙහි සඳහන් විස්තර නිවැරදි බවටත්, සත්‍ය බවටත් සහතික කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත්, මා විසින් ඉදිරිපත් කර ඇති සියලුම බැනර් ප්‍රාදේශීය සභාව සතු කිරීමටත්, ප්‍රදර්ශනය කිරීමෙන් පසු හෙළි වුවහොත්, ඒ සියල්ල කපා ඉවත් කර, සභාව සතු කිරීමටත් යටත් වන බවට එකඟ වෙමි.

....
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

දෙවන උපලේඛනය

මෙම අතුරු ව්‍යවස්ථාවේ 3(3) වන වගන්තියේ සඳහන් ගාස්තු අයකිරීමේ උපලේඛන පහත දැක්වේ.

උපලේඛනය	*රු. ශත*
01. විදුලි බුබුළු වෙනත් විද්‍යුත් උපකරණ යොදා තනා ඇති විශේෂ දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වසරකට වර්ග අඩියක් සඳහා	25 0

උපලේඛනය	රු. ශත
02. ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වසරකට වර්ග අඩියක් සඳහා	25 0
03. ඉඩම් වෙන්දේසි කිරීම සම්බන්ධව ස්ථිර දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වසරකට වර්ග අඩියක් සඳහා	25 0
04. ඉඩම් වෙන්දේසි කිරීම සඳහා ප්‍රචාරක රෙදි බැනර් වෙනුවෙන් වසරකට වර්ග අඩියක් සඳහා	10 0
05. වෙනත් සාමාන්‍ය වසරකට වර්ග අඩියක් සඳහා	10 0
06. කිසියම් බැම්මක, බිත්තියක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වසරකට වර්ග අඩියක් සඳහා	25 0
07. ලී රාමු වල සවිකරන ලද කානුවල හෝ ගස්වල ආදියේ ප්‍රදර්ශනය කරන කුඩා වර්ගයේ දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට	10 0
08. කිසියම් වීථියකට හෝ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලේ මූණතෙහි හෝ වෙළෙඳශාලා නාම පුවරු හෝ ගොඩනැගිල්ලක මූණතෙහි (වෙළඳසැලේ නාමය ප්‍රදර්ශනය සඳහා වර්ග අඩි 25ක ප්‍රමාණයක් ගාස්තු අය කිරීමෙන් නිදහස් වේ.) සීමාව ඉක්මවා යන දිගකින් යුතු ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ එල්ලා තැබීම වෙනුවෙන් වසරකට වර්ග අඩියක් සඳහා	25 0

07-121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.